# ලෝක ජනසංඛ්‍යා ව්‍යාප්තිය

# World Population Distribution

# ලෝක ජනසංඛ්‍යා ව්‍යාප්තිය
# World Population Distribution

ලෝක ජනසංඛ්‍යා ව්‍යාප්තිය සලකා බැලීමේදී ප්‍රධාන සංකේන්ද්‍රණ කලාප හතරක් හඳුනාගත හැකිය

Considering the global population distribution, four major concentration zones can be identified

- නැගෙනහිර ආසියාව East Asia
- දකුණු සහ අග්නි දිග ආසියාව South and Southeast Asia
- වයඹ දිග යුරෝපය Northwestern Europe
- ඊශාන දිග ඇමෙරිකා එක්සත් ජනපදය Northeastern United States

# මීට අමතරව ද්විතීයික සංකේන්ද්‍රණ හතරක් ද හඳුනාගත හැකිය

# In addition, four secondary concentrations can be identified

- උතුරු ඇමෙරිකාවේ බටහිර වෙරළබඩ කලාපය

  The West Coast region of North America

- දකුණු ඇමෙරිකාවේ නැගෙනහිර වෙරළබඩ කලාපය

  East Coast region of South America


- නයිල් ගංගා මෝය ආශ්‍රිත කලාපය

  The Nile River estuary


- සියරා ලියොන්, ලයිබීරියාව, අයිවරි කෝස්ට් සහ ඝානාව

  Sierra Leone, Liberia, Ivory Coast, and Ghana


# ලෝක ජනසංඛ්‍යා ව්‍යාප්තිය
# World Population Distribution



# ලෝක ජනසංඛ්‍යා ව්‍යාප්තිය
# World Population Distribution



## කලාප අනුව ලෝක ජනසංඛ්‍යා ව්‍යාප්තිය
## Distribution of world population by Region




uq,h- http://www.bsad.uvm.edu/NR/rdonlyres/8E0A9BFA-4C07-4A3B-97E1-468FCF510118/1662/picture.gif

# ජනගහනය සංකේන්ද්‍රණය වීම කෙරෙහි බලපා ඇති සාධක

# Factors affecting the concentration of population

# නැගෙනහිර ආසියාව East Asia

මෙම කලාපයේ පිහිටා ඇති රටවල් Countries located in this region
චීනය, ජපානය, දකුණු කොරියාව, උතුරු කොරියාව, තායිවානය
China, Japan, South Korea, North Korea, Taiwan

සාධක **Factors**
ජනාවාස තැනීමට සුදුසු විශාල තැනිතලා ප්‍රදේශ පිහිටා තිබීම
Having large plain areas suitable for habitation
මිනිස් වාසයට හිතකර දේශගුණයක් තිබීම
A climate conducive to human habitation
කෘෂිකර්මයට සුදුසු ඍතුමය වර්ෂාපතනයක් තිබීම
A seasonal rainfall suitable for agriculture
සාරවත් පස් දියළු නිම්න තිබීම
Having valleys of fertile soil
ජල සම්පාදනය කළ හැකි ගංගා රාශියක් තිබීම
Having a large number of rivers
සංස්කෘතික සාධක
Cultural factors

චීනය - අතීතයේ දරුවන් වැඩි පවුල්වලට සමාජයේ විශාල පිළිගැනීමක් තිබීම
China = In the past, more and more families had greater social recognition
මිලියන 10 ට වඩා වැඩි නගර රැසක් මෙම කලාපයේ පිහිටා තිබීම
There are more than 10 million cities in this region
නිදසුන් : ටෝකියෝ, ඔසාකා, සෝල්, ෂැන්හයි, බීජිං, ටොකයිඩෝ
Examples: Tokyo, Osaka, Seoul, Shanghai, Beijing,

# දකුණු හා අග්නිදිග ආසියාව
# South and Southeast Asia

ලෝකයේ දෙවෙනි ජන සංකේන්ද්‍රණ කලාපය

The second most populous region in the world

ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය, ශ්‍රී ලංකාව, නේපාලය,

භූතානය, මාලදිවයින, ඉන්දුනීසියාව, පිලිපීනය

India, Pakistan, Bangladesh, Sri Lanka, Nepal, Bhutan, Maldives, Indonesia, Philippines

- උපත් අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම High birth rate
- ජනගහනයෙන් බහුතරයක් නූගත් වීම සහ කාන්තාවන්ගෙන් බහුතරයකගේ අධ්‍යාපන මට්ටම පහළ මට්ටමක පැවතීම The majority of the population is illiterate and the education level of the majority of women is low
- උපත් පාලනය පහළ මට්ටමක පැවතීම Low birth control
- ආගම, කුලය, සහ ගෝත්‍රි වල සම්ප්‍රධායික අදහස් Traditional view of religion, caste and tribes

මිලියන 10 ට වැඩි නගර: දිල්ලිය, මද්‍රාසිය, ඩකා, කරච්චිය

Cities with more than 10 million: Delhi, Madras, Dhaka, Karachi

# වයඹදිග යුරෝපය Northwestern Europe

බ්‍රිතාන්‍ය, ප්‍රංශය, බෙල්ජියම, ලක්ෂේම්බර්, නෙදර්ලන්තය, ජර්මනිය, පෝලන්තය

Britain, France, Belgium, Luxembourg, Netherlands, Germany, Poland

මෙම කලාපයේ ජනගහනය වර්ධනයට කාර්මික විප්ලවය හෙතු වී තිබේ.

The Industrial Revolution has seen population growth in the region.

- ආර්ථික සහ සමජීය සංවර්ධනය ඉහළ ප්‍රදේශයකි
  Economic and social development
- ඉහළ පරිභෝජන රටාවක් ඇත Have a high consumption pattern
- ශීත දේශගුණයක් පැවතීම Cold climate
- අධ්‍යාපනය වැනි සේවා පහසුකම්වල දියුණුව Improvement of service facilities such as education

මිලියනයකට වැඩි නගර: ලන්ඩන්, පැරිස්, වෝර්සෝ

Over a Million Cities: London, Paris, Warsaw

# ඊශාන දිග ඇමෙරිකා එක්සත් ජනපදය
# **Northeastern United States**

ඇමෙරිකා එක්සත් ජනපදයයේ ඊශාන දිග ප්‍රදේශය හා කැනඩාවේ කොටසක් ද අයත් වේ.

It also includes the northeastern United States and parts of Canada.

- ජන සංක්‍රමණවල ඉහළ වර්ධනයක් තිබීම
- Increasing population growth
- කාර්මික නගර බහුල වීම
  The abundance of industrial cities
- දියුණු වරායන් තිබීම, දියුණු යටිතල පහසුකම්, දියුණු සෞඛ්‍ය, අධ්‍යාපනය වැනි සේවා
- Having advanced ports, advanced infrastructure, advanced health and education services
- විශාල කෘෂිකාර්මික බිම් පිහිටා තිබීම
- Having large agricultural land

මිලියන 10 ට වැඩි නගර: නිව්යෝර්ක්,

More than 10 million cities: New York

මිලියනයකට වැඩි නගර: වොෂිංටන්, මොන්ට්‍රියෙල්, චිකාගෝ, බොස් වොෂ් කලාපය

Over a Million Cities: Washington, Montreal, Chicago, Boss Wash Zone

# ලෝකයේ අඩු ජනගහනයක් සහිත ප්‍රදේශ
# Low populated areas of the world

# තුන්ද්‍රා ප්‍රදේශය Tundra region

ඇලෙස්කාව, ග්‍රීන්ලන්තය, අයිස්ලන්තය, සයිබීරියාව, කැනඩාවේ උතුරු ප්‍රදේශය

Alaska, Greenland, Iceland, Siberia, northern Canada

**ජන සංඛ්‍යාව අඩුවීමට හේතු** The reasons for the decline in population

- ✓ හිමෙන් වැසුනු බිම් තිබීම හා වර්ෂයේ මාස 9 ට වැඩි කාලයක් ඇති ශීත දේශගුණය Snowy ground and cold weather for more than 9 months of the year
- ✓ කෘෂිකර්මයට යෝග්‍ය නොවීම Not suitable for agriculture
- ✓ ගංගාවල දිය මිදීම Freezing of rivers
- ✓ ප්‍රමාණවත් වෘක්ෂලතාවරණයක් නොවීම Inadequate vegetation
- ✓ ගිම්හානය කෙටි වීම Summer is short

# ශුෂ්ක ප්‍රදේශ සහ කාන්තාර **Arid areas and deserts**

ඇරිසෝනා, කැලිෆෝනියා, ඇටකාමා, සහරා, තාර්, අරාබි, ඕස්ට්‍රේලියා, කොලරාඩෝ

Arizona, California, Atacama, Sahara, Tar, Arab, Australia, Colorado

ජන සංඛ්‍යාව අඩුවීමට හේතු The reasons for the decline in population

- ✓ ඉහළ වාර්ෂික උෂ්ණත්වය Higher annual temperature
- ✓ අඩු වර්ෂාව සහ වාෂ්පීකරණය අධිකවීම Low rainfall and high evaporation
- ✓ වැලි කුණාටු සහ දූවිලි Sandstorms and dust
- ✓ නිසරු පස නිසා කෘෂිකර්මයට යෝග්‍ය නොවීම Not suitable for agriculture due to barren soil
- ✓ ප්‍රමාණවත් තරම් වෘක්ෂලතාවරණයක් නොමැතිවීම Lack of adequate vegetation

# නිවර්තන වර්ෂා වනාන්තර Tropical rain forest

ඇමේසන්, කොංගෝ, ඉන්දුනීසියානු දූපත්, මධ්‍යම ඇමෙරිකාවේ වනාන්තර

The Amazon, the Congo, the Indonesian islands, and the forests of Central America

ජන සංඛ්‍යාව අඩුවීමට හේතු The reasons for the decline in population

- ✓ අධික උෂ්ණත්වය සහ අධික වර්ෂාපතනය High temperature and heavy rainfall
- ✓ මිනිසුන් අලස කරන කාලගුණය The weather that makes people lazy
- ✓ සුගමතාවය අඩුවීම Lack of accessibility
- ✓ සතුන්ගෙන් පීඩා විඳීමට සිදුවීම Suffering from animals
- ✓ මැලේරියා, බරවා, කහඋණ වැනි රෝග බහුල වීම The most common diseases are malaria, barava and yellow fever
- ✓ සංරක්ෂිත ප්‍රදේශ වීම Being a protected area

# කඳුකර ප්‍රදේශ Mountainous areas

රොකි, අන්ඩිස්, ඇල්ප්ස්, පිරනීස්, හිමාලය, අට්ලස්, යූරල්, ඉතියෝපියානු උස් බිම්

Rocky, Andes, Alps, Pyrenees, Himalayas, Atlas, Ural, Ethiopian Highlands

ජන සංඛ්‍යාව අඩුවීමට හේතු The reasons for the decline in population

- ✓ සුගමතාවය අඩු වීම Lack of accessibility
- ✓ ග්ලැසියර් ඛාදනයට ලක් වූ නිසරු බිම් Glacier erosional barren lands
- ✓ අධික ශීතල සහ හිමෙන් වැසී තිබීම Freezing rain and frost
- ✓ වගා කළ නොහැකි වීම Inability to cultivate
- ✓ ඛනිජ සම්පත් නොමැති වීම Inability to cultivate
- ✓ ස්වසන අපහසුතා Respiratory difficulties